# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1430/5 – 2006 ජනවාරි 30 වැනි සඳුදා – 2006.01.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී 4/96.

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ 59 වන වගන්තියේ (4) උප වගන්තිය සමඟ කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

පිලික්ස් පෙරේරා,
ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය.

2006 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2006 ත්‍යාග ප්‍රදාන පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.
2. මෙම පනතේ 59 වන වගන්තියේ (4) වන උප වගන්තියේ (අ), (ආ) හෝ (ඇ) යන ඡේදයන්හි සඳහන් තැනැත්තෙකුට ත්‍යාගයක් වශයෙන් ධීවර ත්‍යාග අරමුදලින් ගෙවිය හැකි උපරිම මුදල් ප්‍රමාණය රුපියල් පන්දහසක් (රු. 5,000) විය යුතුය.
3. මෙම නියෝගවල කාර්යය සඳහා –

"පනත" යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත අදහස් වේ.

"ධීවර ත්‍යාග අරමුදල" යන්නෙන් පනතේ 59 වන වගන්තිය මගින් පිහිටුවන ලද ධීවර ත්‍යාග අරමුදල අදහස් වේ.

02-471

1A-G 006593— 1,495 (2006/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.